දිවි තොර කර ගැනීමට තැත් කිරීම් වාර්තාකරණයන්, හාවාතිෂය කාටූනයන් සහ කාන්තාවන් ඒකාකෘතික කිරීම්

දෙදෙනෙකු දිවි තොර කරගැනීමට තැත් කළ පුවතක් අරුණ පුවත්පතේ (10/12) දැක්වී තිබිණි. එය එදින අරුණ සහෝදර ඉංග්‍රීසි භාෂා පුවත්පත වන The Morning හි පළ වී නොතිබුණි.

1) මෙහි දිවි තොර කර ගැනීමට තැත් කළ ආකාරය සඳහන්ව තිබූ අතර, කාටූනයෙන්ද එය දක්වා තිබිණි. දිවි තොර කර ගත හැකි ආකාරයන් සඳහන් නොකරන මෙන් මාධ්‍ය ආචාර ධර්ම පවසයි. ඊට හේතුව, එය අනුකරණාත්මක දිවි තොර කරගැනීම් දක්වා දිගු වීමට ඇති හැකියාවයි.

2) මෙම පුවත් වාර්තාව හා දැක්වෙන කාටූනය මගින් දිවි තොර කරගැනීමට තැත් දැරීම හාවාතිෂය ලෙසින් ඉදිරිපත් වී ඇත. මාධ්‍ය ආචාර ධර්ම පවසන්නේ, එසේ දිවි තොර කර ගැනීම් හාවාතිෂය ලෙසින් දැක්වීම ඔස්සේ, දිවි තොර කරගැනීම් වර්ණනාත්මකව පෙනී යැමත්, දිවි තොර කරගැනීමට නැඹුරුවක් ඇති තවත් අයෙකු තමන්ව ඒ හා අනන්‍ය කර ගැනීමත් විය හැකි බවයි.

3) මෙම පුවත හා උපකාරක අංක සඳහන් වී නැත.මෙවැනි පුවතක් හා හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, මෙම පුවත කියවන දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකු, ජීවිතය නැති කරගැනීමට පෙළඹීම වෙනුවට උපකාර ලබාගැනීමට ධෛර්යමත් විය හැක. ඒ ඔස්සේ ජීවිතයක් බේරා ගැනීමට ඉඩක් ලැබෙනු ඇත.

එසේම, මෙම පුවත සමස්තයක් ලෙසින් හාවාතිෂය කාටූනයක් ඔස්සේ දැක්වී ඇත. ඒ ඔස්සේ කාන්තාවන්ව ඒකාකෘතික කිරීමක් සිදුවිය හැකි යැයි ඔබ නොසිතන්නේද?

මෙසේ ගත් විට, දිවි තොර කරගැනීමට තැත් දැරීමක් මෙම පුවත් වාර්තාව ඔස්සේ වගකීම් සහගත අයුරින් ඉදිරිපත්ව ඇතැයි ඔබ සිතන්නේද?

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf

**#MediaEthicsSL #lka #sinhalanews #Aruna**